**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2023**

**-------------------------------------------------------------------------------------**

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2011 ඔක්තෝබර් 21 දිනැති 2790-එස්ආර්අයි (එස්එෆ්) අංක දරන සහ 2016 නොවැම්බර් 02 දිනැති 3431 - එස්ආර්අයි (එස්එෆ්) අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර ගිවිසුම්ගත ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, එවකට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසු ණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා ප්‍රවාහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම් අංක 2790 එස්ආර්අයි (එස්එෆ්) ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940කට සමාන එජඩො මිලියන 68.8 ක් වූ අතර ඉන් රු.මිලියන 7,670කට සමාන එජඩො මිලියන 59ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.මිලියන 1,339.33කට සමාන එජඩො මිලියන 9.8ක් ශ්‍රී ලංකා රජය දායක වීමට එකඟ වී තිබුණි. පසු ණය ගිවිසුම් අංක 3431 එස්.ආර්.අයි. (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්යසාධනය පුළුල් කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 8,700කට සමාන එජඩො මිලියන 60ක අතිරේක ණය මුදලක් ලබාගෙන තිබුණි. ශ්‍රී ලංකා රජයේ රු.මිලියන 1,071.47කට සමාන එජඩො මිලියන 7.8ක දායකය සමග ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,771.47කට සමාන එජඩො මිලියන 67.8ක් වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2024 ජනවාරි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම් හැර, ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාතේ CKD - 10D පැකේජයට අදාළ රුපියල් මිලියන 27 ක අත්තිකාරම් බැඳුම්කරය මුදල් කර ඇති අතර, සම්පූර්ණ නොකළ වැඩවලට අදාළ රුපියල් මිලියන 27 ක් සිවිල් වැඩ ගිණුමට බැර කර ඇත. ඒ අනුව සිවිල් වැඩ ප්‍රමාණය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | මධ්‍යම පළාතේ CKD 10-D කොන්ත්‍රාත්කරුගේ අත්තිකාරම් බැඳුම්කර මුදල් කර ඇති අතර එම මුදල සිවිල් වැඩවල වටිනාකමෙන් අඩු කර ඇත. එම මුදල රුපියල් 26,646,116ක් අමාත්‍යාංශයට ප්‍රේෂණය කර ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 04ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති 01/2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂය තුළ 04ක් පැවැත්විය යුතු වේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් දෙකක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| **(අ) මෘදුකාංග වත්කම් කළමනාකරණය** | | |
| මෘදුකාංගය ස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතන 07 න් 05 ක් විගණනය කිරීමේදී මෘදුකාංගය ස්ථාපනය කරන අවස්ථාවේ ඇතුළත් කළ වත්කම්වල දත්ත පමණක් මෘදුකාංගයේ දත්ත සමුදාය පද්ධතියේ පැවති අතර එම දත්ත යාවත්කාලීන කර නොතිබුණි. තවද, එම දත්ත භාවිතයෙන්, වත්කම් | මෙහෙයුම අතරතුර, මෘදුකාංගය අඛණ්ඩව යාවත්කාලීන කළ යුතු අතර, දත්ත නිතිපතා පද්ධතියට ඇතුළත් කළ යුතු බව සත්‍යයකි. මාර්ග, වීදි ලාම්පු සහ පාලම් සම්බන්ධ තොරතුරු වැනි ක්ෂේත්‍රයෙන් රැස් කළ යුතු විස්තීරණ දත්ත අනුව, නිවැරදි හා යාවත්කාලීන වාර්තා පවත්වාගෙන යාම සඳහා | ව්‍යාපෘති කාලය තුළ වැඩිදියුණු කිරීම සහ ඉන් අනතුරුව තාක්ෂණික ගැටලු විසඳීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම වැනි අඛණ්ඩ ක්‍රියාවලියක් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කළමනාකරණය සඳහා තීරණ ගත හැකි ඕනෑම තොරතුරක් මෙම මෘදුකාංගය හරහා සකස් කර පරිශීලකයාට ලබා දිය නොහැකි බවත්, පළාත් පාලන ආයතන විසින් මෘදුකාංග භාවිතා නොකර එම කාර්යයන් ඉටු කිරීම සඳහා පැතුරුම් පත් භාවිතා කරන බවත් නිරීක්ෂණය විය. එබැවින් මෘදුකාංග භාවිතා කරන්නන්ට ප්‍රමාණවත් දැනුමක් ලබාදී නොමැති බව නිරීක්ෂණය විය. | ස්ථාවර යාවත්කාලීන කිරීම් අත්‍යවශ්‍ය වන අතර එම කාර්යයන් සභාවල අඛණ්ඩ වගකීම් වේ. | |

(ආ) **ජල සැපයුම් ව්‍යාපෘති**

| | | |
|---|---|---|
| ජල සම්පාදන පහසුකම් නොමැතිකම, ප්‍රවේශ මාර්ග නොමැතිකම, ගොඩනැගිලි සැලසුම්වලට අනුකූල නොවීම, ආදාහනාගාරයක් සඳහා මහජන ඉල්ලුමක් නොමැතිකම, ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම, ජල ටැංකි ඉදිකිරීමේදී බිම් මට්ටම සැලකිල්ලට නොගැනීම, කොවිඩ්-19 වසංගතයේ බලපෑම, ජල පිරිපහදු යන්ත්‍රවල ප්‍රමාණවත් ධාරිතාවක් නොමැතිකම සහ ශ්‍රවණාගාරය/ ප්‍රජා ශාලාව ප්‍රයෝජනයට ගැනීම සඳහා නිසි සැලසුමක් නොමැතිකම හේතුවෙන් ආරම්භ කර අතරමඟ නවතා තිබූ ව්‍යාපෘති 33ක් සඳහා රුපියල් මිලියන 3,809ක් වැය කර තිබුණි. | දැනට එක් උප ව්‍යාපෘතියක් හැර අනෙකුත් උප ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු සඳහා හෝ අවම වශයෙන් වෙනත් ප්‍රයෝජනවත් අරමුණු සඳහා භාවිතා කරයි. සමහර ඒවා ප්‍රයෝජනයට නොගන්නා බව පිළිගනිමි. වත්කම් නිෂ්ක්‍රීය නොවී නිසි පරිදි පරිහරණය කරන ලෙස සියලුම පළාත් සභාවලට දැඩි ලෙස උපදෙස් දෙන ලදී. | සියලුම වත්කම් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිලාභීන්ට පහසුකම් සැපයිය යුතුය. |

## 3.2 පද්ධති හා පාලන

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය ආවරණය වන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය පුළුල් කර ඇත. කෙසේ වෙතත් සමාලෝචිත වසර තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | සේවක තනතුරු අඩුවීම හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ශාඛාව මෙම ව්‍යාපෘතිය කළමනාකරණය කරන අතර විගණන විමර්ශනය තවදුරටත් වැඩිදියුණු කිරීමට සෑම ප්‍රයත්නයක්ම ගනු ලැබේ. | අභ්‍යන්තර විගණනය නිසි ලෙස ක්‍රියාත්මක විය යුතුය. |